## 2022.01.13 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව

**පැමිණීම**

1. බී. කන්දසාමි මහතා - ගරු සභාපති
2. වයි.එම්.නිමල් අමරසිරි මයා - ගරු උපසභාපති
3. සෙල්ලයියා සගාදේවන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
4. කේ.එම්. විමලසිරි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
5. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
6. සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. ප්‍රැන්ස්සි වයලට් රෝස් මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
8. මාරප්පන් කන්දසාමි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
9. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
10. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. එල්.එච්. ඉන්දික සම්පත් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
13. එම්.ඒ. නිල්මිණි චන්ද්‍රකාන්ති මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
14. ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
15. ඩී. සුදත් අරුණඅංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. තංගවේලු මහේන්ද්‍රන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. ආර්.එල්. සුදර්ශන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
19. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
20. වේලුසාමී එලිල් අරසි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී

**01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2021-12-13 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව හා 2021-12-26 වන දින පවත්වන ලද විශේෂ මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා අදහස් දක්වමින් පසුගිය මහ සභා රැස්වීමේ වෙනත් කරුණු වාරයේ දී ග්ලැන්නෝර් වතු යායේ වෙසෙන ඇතැම් කණ්ඩායමක් විසින් යන්න වෙනුවට ග්ලැන්නෝර් වතු යායේ ජීවත් වන පවුලක් විසින් යන්න මහ සභා වාර්තාවේ සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව එකී සංශෝධනයට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා

මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

- ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ඩිපෝවේ හි ඩිපෝ කළමණාකරු විසින් 2021-12-10 වන දින ශ්‍රීලංගම/බදු/ඩික/2021/01 අංක දරණ ලිපිය ප්‍රකාරව මාර්ග අංක 98 හා 99 යටතේ කොළඹ - බදුල්ල මගී ප්‍රවාහනය කරනු ලබන බස් රථවල ගමන් මාර්ගය පිළිබඳ විස්තර ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මයා

- බණ්ඩාරවෙල, කහත්තේවෙල, කොටුවත්ත හි පදිංචි චාන්දනී විජේසුන්දර මිය විසින් නිවසට අවධානම් වූ ගසක් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය

- දියතලාව , ගල්පට්ටි අරාව හි පදිංචි ඩී.එම්. අනුර බණ්ඩාර දිසානායක මහතා පිලිකා ආධාර ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා

- 2022 වර්ෂයේ අයවැය යෝජනා - බ/ජනානන්ද ජාතික පාසලේ සුහුරු පන්ති කාමරය නිම කිරීම.

- හපුතල ගම කොට්ඨාසයේ ප්‍රාදේශීය සභාවට අයත් ගම් සභා මාර්ගයක් යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා බැකෝ යන්ත්‍රය ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මයා

- හපුතලේ , ග්ලැන්නෝර් වතුයායේ ජීවත් වන ආර්.මේගලා යන අය විසින් අපදා තත්ත්වයට මුහුණ දීම සම්බන්ධයෙන් නිසි පියවර නොගැනීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නැවත දැනුවත් කරන මෙන් යොමු කර ඇති ලිපිය

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ සභා අරමුදලෙන් කරනු ලබන සෑම වියදමක් සම්බන්ධයෙන් ද එසේම අරමුදලට රැස්කරනු ලබන සෑම ආදායමක් සම්බන්ධයෙන්ද ඊට අදාල වන ක්‍රියාමාර්ග හා ආනුශාංගික ක්‍රියා මාර්ග

වෙනුවෙන් සභාවට උපදෙස් ලබා දීම පිණිස ද හා ඊට අතිරේක වශයෙන් මතුවට සම්මත කරනු ලබන යෝජනාවක් යටතේ සභාව විසින් පවරා දෙනු ලබන කවර හෝ බලතල ඇත්නම් එම බලතල ක්‍රියාත්මක කිරීම පිණිස 2022 වර්ෂයට මෙම ප්‍රාදේශිය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවක් පත්කර ගත යුතු යැයි ද එහි සංයුතිය හා පවරනු ලබන බලතල නිශ්චය කර ගත යුතු යැයි ද යෝජනා කරන්නී ය.

**<u>සංයුතිය</u> -**

ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සභාපති වන්නේ ය.

**<u>බලතල</u>**

- සභා අරමුදලෙන් සිදු කරනු ලබන සියළුම පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් නිර්දේශ කිරීමත් වරකට රුපියල් ලක්ෂ 5 ක් දක්වා වූ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අනුමත කිරීම.

- ප්‍රාදේශීය සභාවෙහි ප්‍රසම්පාදන කමිටුව ලෙස කටයුතු කිරීම.

- ලක්ෂ 02 දක්වා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ගරු සභාපතිවරයාට බලතල පැවරීම.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා</u>

<u>විවාද</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ සභා අරමුදලෙන් කරනු ලබන සෑම වියදමක් සම්බන්ධයෙන් ද එසේම අරමුදලට රැස්කරනු ලබන සෑම ආදායමක් සම්බන්ධයෙන් ද ඊට අදාල වන ක්‍රියාමාර්ග හා ආනුශාංගික ක්‍රියා මාර්ග වෙනුවෙන් සභාවට උපදෙස් ලබාදීම පිණිස ද හා ඊට අතිරේක වශයෙන් මතුවට සම්මත කරනු ලබන යෝජනාවක් යටතේ සභාව විසින් පවරා දෙනු ලබන කවර හෝ බලතල ඇත්නම් එම බලතල ක්‍රියාත්මක කිරීම පිණිස 2022 වර්ෂයට මෙම ප්‍රාදේශිය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවක් පත්කර ගත යුතු යැයි ද එහි සංයුතිය හා පවරනු ලබන බලතල නිශ්චය කර ගත යුතු යැයි ද මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2022 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.අනුලාවතී මල්ලිකා මහත්මිය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාගර් මහතා

ඒ අනුව 2022 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්.විමලසිරි මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ තත්කාර්ය අතුරු ආග්‍රිමය ලෙස රු 100,000.00ක මුදලක් සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.විමලසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභාවේ තත්කාර්ය අතුරු ආග්‍රිමය ලෙස රු 100,000.00ක මුදලක් සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී දෙවන අත්සන්කරු වන ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි තනතුර වෙනස් වූ බැවින්

ඒ සඳහා පළමු අත්සන සභා ලේකම් ද දෙවන අත්සන ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතා වෙතද පැවරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.විමලසිරි මහතා

විවාද

ප්‍රාදේශීය සභා පනතේ 133 වන වගන්තිය සමඟ කියවිය යුතු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා චෙක්පත් අත්සන් කිරීමේ දී දෙවන අත්සන්කරු වන ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි තනතුර වෙනස් වූ බැවින් ඒ සඳහා පළමු අත්සන සභා ලේකම් ද දෙවන අත්සන ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි කේ.එම්.ජේ.ඩී. අනුර බණ්ඩාර මහතා වෙතද පැවරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 04

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල අනවසර ඉදිකිරීම්. පාරිසරික ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකි ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් නාගරික සීමාවන්ට පරිබාහිර බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම පිණිස අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පිණිසත් හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් නිවාස. හා ප්‍රජා සංවර්ධන කමිටුවක් 2022 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල අනවසර ඉදිකිරීම්. පාරිසරික ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකි ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් නාගරික

සීමාවන්ට පරිබාහිර බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම පිණිස අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පිණිසත් හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවක් 2022 වර්ෂය සඳහා පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්ලයියා සගාදේවන් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී. සුදත් අරුණඅංජන මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මාරප්පන් කන්දසාමි මහතා

ඒ අනුව 2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පාරිසරික ගැටලු හා සෞඛ්‍ය පහසුකම් පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකි ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවක් පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ප්‍රභාගර් මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පාරිසරික ගැටලු හා සෞඛ්‍ය පහසුකම් පිළිබඳව අවධානය යොමු කරමින් ගරු සභාව වෙත එකි ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවක් පත්කර ගතයුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ප්‍රැන්ස්සි වයලට් රෝස් මහත්මිය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එම්.ඒ. නිල්මිණි චන්ද්‍රකාන්ති මහත්මිය

ඒ අනුව 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ආර්.එම්.අනුලාවතී මල්ලිකා මහත්මිය විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාහර් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල කාර්මික සේවා හා තාක්ෂණික කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් කාර්මික සේවා තාක්ෂණික කමිටුවක් 2022 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) විධි විධාන පරිදි හා 14(1) බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල කාර්මික සේවා හා තාක්ෂණික කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් කාර්මික සේවා තාක්ෂණික කමිටුවක් 2022 වර්ෂය සඳහා පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2022 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරුන් 04 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. එල්. සුදර්ශන මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්ද්‍රන කිත්සිරි පෙරේරා මහතා
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි වේලුසාමී එලීල් අරසි මහත්මිය

ඒ අනුව 2022 වර්ෂය සඳහා කාර්මික සේවා තාක්ෂණික කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව තුල පුස්තකාල කමිටුවක් ස්ථාපිත කිරීම තුලින් පුස්තකාල කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් 2022 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවක් පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව තුල පුස්තකාල කමිටුවක් ස්ථාපිත කිරීම තුලින් පුස්තකාල කටයුතු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිසත් එකී නිරීක්ෂණ හා නිර්දේශ මත ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීම පිණිසත් 2022 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවක් පත්කර ගත යුතු යැයිද එහි සංයුතිය නිශ්චය කර ගත යුතු යැයිද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2022 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවේ සංයුතිය ගරු මන්ත්‍රීවරියන් 02 දෙනෙකුගෙන් සමන්විත වන අතර ගරු සභාපතිතුමා නිල බලයෙන් පුස්තකාල කමිටුවේ සභාපති වන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව පෙර වර්ෂවල සිටි නිලධාරින් ද ඇතුලුව පුස්තකාල කමිටුව පත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

2022 වර්ෂය සඳහා පුස්තකාල කමිටු සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් පත්කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි වේලුසාමී එලීල් අරසි මහත්මිය
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මහත්මිය

ඒ අනුව 2022 වර්ෂය සඳහා පුස්තකාල කමිටුවේ සාමාජිකයන් ලෙස ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රිවරියන් සුදුසු යැයි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සවරිමුත්තු ප්‍රභාහර් මහතා විසින් යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.විමලසිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීම සුදුසු බවත්,

01. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - කේ.එම්.ජේ.ඩී.අනුර බණ්ඩාර මයා
02. කාර්මික නිලධාරී - ආර්.එම්. ආනන්ද උපතිස්ස මයා
03. සංවර්ධන නිලධාරී - ඒ.ජේ.එම්. පාලිත ජයසුන්දර මයා

තවද, අවශ්‍ය වන සුවිශේෂී අවස්ථාවල අදාළ තාක්ෂණ සේවා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත සාමාජිකයෙකු බාහිර ආයතනයකින් පත් කිරීම සුදුසු බවද, යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීම සුදුසු බවත්,

01. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - කේ.එම්.ජේ.ඩී.අනුර බණ්ඩාර මයා
02. කාර්මික නිලධාරී - ආර්.එම්. ආනන්ද උපතිස්ස මයා
03. සංවර්ධන නිලධාරී - ඒ.ජේ.එම්. පාලිත ජයසුන්දර මයා

තවද, අවශ්‍ය වන සුවිශේෂී අවස්ථාවල අදාළ තාක්ෂණ සේවා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත සාමාජිකයෙකු බාහිර ආයතනයකින් පත් කිරීම සුදුසු බවද ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ගරු මහජන නියෝජිතයින් 20දෙනා නියෝජනය කරනු ලබන කොට්ඨාස ආවරණය වන පරිදි ලියාපදිංචි ප්‍රජා සංවිධාන 20ක් සඳහා සුභසාධක කටයුතු වෙනුවෙන් කැනපි හට් 20ක් ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත ලබා දීම සුදුසු බව යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

ගරු මහජන නියෝජිතයින් 20දෙනා නියෝජනය කරනු ලබන කොට්ඨාශ ආවරණය වන පරිදි ලියාපදිංචි ප්‍රජා සංවිධාන 20ක් සඳහා සුභසාධක කටයුතු වෙනුවෙන් මහජන සුභ සාධනය මූලික කොට ගෙන කැනපි හට් 20ක් ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත ලබා දීම සුදුසු බවත් එකී කැනපි හට් මිලදී ගැනීමේදී කැනපි ආවරණයෙ හි කල්පැවැත්ම මෙන්ම ජී.අයි. බට කාර්මික නිලධාරි ඇස්තමේන්තු ප්‍රකාරව හොඳ වර්ගයෙන් ලබා ගැනීම සුදුසු බවත් මිලදී ගැනීමේ දී 10*20 ප්‍රමාණයේ හෝ 10*10 ප්‍රමාණයෙන් ලබා ගැනීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා විසින් අදහස් දක්වමින් 10*20 ප්‍රමාණයේ කැනපිහට් සවි කිරීමට තරම් ඇතැම් නිවෙස් වල ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් 10*10 ප්‍රමාණයේ කැනපි හට් 02 ක් ඒ සඳහා ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් සුභසාධක කටයුතු වෙනුවෙන් කැනපි හට් ලබා දීමේ දී මරණාධාර සමිති සඳහා එකී කැනපි හට් ලබා දීම සිදු නොකරන ලෙසත් ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා ලබා දීම සුදුසු බවත් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් කැනපි හට් ලබා දීමේ දී කැනපි ආවරණය සඳහා රෙදි වෙනුවට තහඩු ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් තහඩු ආවරණ සඳහා විශාල මුදලක් වැය වන බව ප්‍රකාශ කළ අතර කැනපි හට් ලබා දීමේ දී අයදුම් කල යුතු වන්නේ ලියාපදිංචි සමිති බවත් ප්‍රමාණාත්මකව බැලීමේ දී 10*20 ප්‍රමාණයෙන් එක් කැනපියක් හෝ 10*10 ප්‍රමාණයෙන් කැනපි 02ක් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 10

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ග්ලැනනෝර් වසමේ පදිංචි සෙල්ලයියා සගාදේවන් මහතා වකුගඩු ආශ්‍රිත රෝගී තත්වයෙන් පසුවන බවත් මසකට රු 40,000.00ක පමණ මුදලක් ඖෂධ සඳහා වැය වන බවත් ඒ සඳහා වියදම් දැරීමේ අපහසුතාවය පිළිබඳ මා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර එකී ඉල්ලීමට අනුව එකී අපහසුතාවය සළකා බලා වෛද්‍ය වාර්තා පදනම් කර ගනිමින් ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත්ව රු 100,000.00ක මුදලක් සභා අරමුදලින් ලබාදීම සුදුසු බව යෝජනා කරන්නීය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

විවාද

හපුතලේ ග්ලැනනෝර් වසමේ පදිංචි සෙල්ලයියා සගාදේවන් මහතා වකුගඩු ආශ්‍රිත රෝගී තත්වයෙන් පසුවන බවත් මසකට රු 40,000.00ක පමණ මුදලක් ඖෂධ සඳහා වැය වන බවත් ඒ සඳහා වියදම් දැරීමේ අපහසුතාවය පිළිබඳ මා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර එකී ඉල්ලීමට අනුව එකී අපහසුතාවය සළකා බලා වෛද්‍ය වාර්තා පදනම් කර ගනිමින් ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත්ව රු 100,000.00ක මුදලක් සභා අරමුදලින් ලබාදීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 11**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලෙන් ප්‍රජාව සඳහා සහන සැලසීම මූලික කරගෙන සිදු කරනු ලැබූ කාර්යයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි පසුගිය වර්ෂය සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද ද්‍රව්‍යාධාර ලබා දීම් මේ වන විට වත්මන් ආර්ථිකය තුළ භාණ්ඩ මිල සීග්‍රයෙන් උච්චාවචනය වීම මෙන්ම වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හිඟතාවය හේතුවෙන් ප්‍රජාව වෙත ද්‍රව්‍යාධාර ලබා දීම සිදු කළ නොහැකි බැවින් ද්‍රව්‍යාධාර ලබා දීම වෙනුවට එකී අනුමත කරන ලද කාර්යයන් සඳහා එම මුදලින් ඉටුකරනු ලැබූ කාර්ය පිළිබඳව සහතිකයක් / තහවුරුවක් ලබාගැනීමෙන් අනතුරුව මූල්‍යාධාර ලබාදීම සුදුසු බව යෝජනා කරන්නී ය.

**2021 සභා අරමුදලින් ද්‍රව්‍ය ආධාර ලබාදීම**

| කමිටු යෝජනා දිනය | යෝජනා අංකය සහ යෝජනාව | මුදල | ස්වභාවය<br>ක්‍රියාත්මකයි |
|---|---|---|---|
| 2/2/2021 | 14. ටී මහෙන්ද්‍රන් මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට අනුව අඩු ආදායම්ලාභී තංගමලේ වත්ත අංක 6 හපුතලේ පදිංචි එල්. ආරුමුගම් මයාට ද්‍රව්‍ය ආධාර බ්ලොක් ගල් 80 ක් ලබාදීම රු 5000 | 5000 | ඇනවුම ලබාදී ඇත බිල්පත ගෙවීමට ඇත |
| 3/2/2021 | 5. එස්. ප්‍රභාගර් මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට අනුව කහගලවත්ත හපුතලේ පදිංචි ජේ.එල්ලම්මා ට 5000 ක ද්‍රව්‍ය ආධාර බ්ලොක්ගල් ලබාදීම | 5000 | ඇනවුම ලබාදී ඇත |
| 3/2/2021 | 6. එස්. ප්‍රභාගර් මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට අනුව අංක 6 කහගල වත්ත හපුතලේ පදිංචි බී. කැලිස්ටා මේරි අය සඳහා 5000 ක ද්‍රව්‍ය ආධාර බ්ලොක් ගල් 80 ක් ලබාදීම | 5000 | ඇනවුම ලබාදී ඇත බිල්පත ගෙවීමට ඇත |
| 3/2/2021 | 7. නිල්මිණි චන්ද්‍රකාන්ති මන්ත්‍රීතුමියගේ ඉල්ලීම අනුව වකාරාව කහගොල්ල දියතලාව පදිංචි ජී.එච්. ප්‍රියංකා අනුරුද්ධිකා මියට 5000 ද්‍රව්‍යාධාර බ්ලොක්ගල් 80 ක් ලබාදීම | 5000 | මිල කැඳවීමට යොමුකලා |
| 3/2/2021 | 11. චන්දන කිත්සිරි මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව කදු සෙවන සුහදගම දියතලාව පදිංචි ඩබ්.එම්. විමල් කරුණාරත්න අය සඳහා 5000 ක ද්‍රව්‍ය ආධාර සෙවිලි තහඩු 3 ක් ලබාදීම | 5000 | මිල කැඳවීමට යොමුකලා |
| 4/5/2021 | 4. එස්. වයලට් රෝස් මන්ත්‍රීතුමියගේ ඉල්ලීම අනුව අංක 45 තොටලාගල වත්ත හපුතලේ පදිංචි ආර්. සුරේෂ් ට 5000 ක ද්‍රව්‍ය ආධාර බ්ලොක්ගල් 80 ක් ලබාදීම | 5000 | මිල කැඳවීමට යොමුකලා |
| 4/5/2021 | 13. සීගිරි ලංකා ඒකනායක මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව තැන්නපිට කිරවනාගල්බිස්ස ක්‍රීඩාපිටිය ආවරණය කිරීම 38223.32 ජීඅයි බට 10 ක් අගල් 2 ලබාදීම | 38223.32 | ඇස්තමේන්තුව වෙනස්වීමට ඇත |

| | | | |
|---|---|---|---|
| 5/4/2021 | 5. ඉන්දික සම්පත් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මත දියතලාව පහල කදුරුගමුව ඇල්බැද්දගල පදිංචි කේ.ඩී. රංජනී පිලිෂියා අයට ද්‍රව්‍ය ආධාර සෙවිලි තහඩු ලබාදීම | 5000 | මිල කැදවීමට යොමුකලා |
| 9/3/2021 | 7. අනුලාවතී මල්ලිකා මන්ත්‍රීතුමියගේ ඉල්ලීමට අනුව බණ්ඩාරවෙල ඇත්තලපිටිය කහටගස්තැන්න අංක 16 පදිංචි කේ.එම්. ජයතිස්ස අයට ද්‍රව්‍යා ආධාර 5000 | 5000 | මිල කැදවීමට යොමුකලා |
| 12/6/2021 | 15.විමලසිරි මන්ත්‍රීතුතුමාගේ ඉල්ලීමට අනුව බණ්ඩාරවෙල ඇත්තලපිටිය කහටගස්තැන්න පදිංචි එම්.පී. රංජනී හේමලතා අයට ද්‍රව්‍යා ආධාර 5000 | 5000 | අනුමැතිය සදහා යොමුකලා |
| 12/6/2021 | 16. අනුලාවතී මල්ලිකා මන්ත්‍රීතුමියගේ ඉල්ලීමට අනුව පරදෙහිඅරාව, පහල කහත්තේවෙල, බණ්ඩාරවෙල පදිංචි ජේ.එම්. විමලාවතී අයට ද්‍රව්‍යා ආධාර 5000 | 5000 | අනුමැතිය සදහා යොමුකලා |
| | **එකතුව** | **88223.32** | |

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් පිහිටවනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලෙන් ප්‍රජාව සඳහා සහන සැලසීම මූලික කරගෙන සිදු කරනු ලැබූ කාර්යයන් වෙනුවෙන් පහත සඳහන් පරිදි පසුගිය වර්ෂය සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද ද්‍රව්‍යාධාර ලබා දීම් මේ වන විට වත්මන් ආර්ථිකය තුළ භාණ්ඩ මිල සීග්‍රයෙන් උච්චාවචනය වීම මෙන්ම වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හිඟතාවය හේතුවෙන් ප්‍රජාව වෙත ද්‍රව්‍යාධාර ලබා දීම සිදු කළ නොහැකි බැවින් ද්‍රව්‍යාධාර ලබා දීම වෙනුවට එකී අනුමත කරන ලද කාර්යයන් සඳහා එම මුදලින් ඉටුකරනු ලැබූ කාර්ය පිළබඳව සහතිකයක් / තහවුරුවක් ලබාගැනීමෙන් අනතුරුව මූල්‍යාධාර ලබාදීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

මෙම යෝජනාව සිදු කරනුයේ ඉහත සඳහන් යෝජනා 11 සඳහා පමණක් බවත් 2022 වර්ෂය සඳහා එක් සභිකයෙක් සඳහා රු.10,000.00ක දීමනාවක් ලබා දීම සඳහා වූ යෝජනාව ඉදිරි මහ සභා වාරයේ දී සභා සම්මත කිරීම සුදුසු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ (LDSP) සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක /UVA/DIV/BD/COM දරණ 2021.06.30 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි ප්‍රමුඛතා අංක 67 මඟින් යෝජනා ඉදිරිපත් වී 2021.07.12 වන දින මහ සභා රැස්වීම් යෝජනා අංක 03 යටතේ සභා සම්මත කරන ලද දියතලාව පොදු වෙළඳ මධ්‍යස්ථානය හා රථ ගාල් සැකසීම යන යෝජනාවෙන් පොදු වෙළඳ මධ්‍යස්ථානය ඉදි කිරීම සුදුසු බවට වූ යෝජනාව නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාල සැලැස්ම අනුමත නොකළ හෙයින් හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී මතු වූ විරෝධතාවය මත වෙනස් කිරීමට සිදු වූ අතර ඒ අනුව දියතලාව බස් නැවතුම්පල පිහිටි ස්ථානයේ වහලය ඉවත් කර එකී ගොඩනැගිල්ලේ සාප්පු සංකීර්ණයක් ලෙස ඉදි කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය

විවාදය

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතියේ (LDSP) සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අංක /UVA/DIV/BD/COM දරණ 2021.06.30 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි ප්‍රමුඛතා අංක 67 මඟින් යෝජනා ඉදිරිපත් වී 2021.07.12 වන දින මහ සභා රැස්වීම් යෝජනා අංක 03 යටතේ සභා සම්මත කරන ලද දියතලාව පොදු වෙළඳ මධ්‍යස්ථානය හා රථ ගාල් සැකසීම යන යෝජනාවෙන් පොදු වෙළඳ මධ්‍යස්ථානය ඉදි කිරීම සුදුසු බවට වූ යෝජනාව නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාල සැලැස්ම අනුමත නොකළ හෙයින් හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස කුට්ටිආරච්චි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී මතු වූ විරෝධතාවය මත වෙනස් කිරීමට සිදු වූ අතර ඒ අනුව දියතලාව බස් නැවතුම්පල පිහිටි ස්ථානයේ වහලය ඉවත් කර එකී ගොඩනැගිල්ලේ සාප්පු සංකීර්ණයක් ලෙස ඉදි කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් එකී යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් නොඑසේ නම් දියතලාව බස් නැවතුම්පල වත්මනෙ හි පවතින ආකාරයෙන්ම පවතින බවත් මේ යෝජනාව පරිදි සභාව මැදිහත් වී සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සිදු කළ යුතු බවත් එවිට එකී කටයුතු ඉදිරියට පවත්වා ගැනීම සිදු වේවි යන්නත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දියතලාව බස් නැවතුම්පල ඉදි කිරීමේ දී යෝජිත වූයේ තවත් මහළක් ඉදි කිරීම බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

බණ්ඩාරවෙල, පහල කහත්තේවෙල , බොරගහ උල්පත ලිපිනයේ පදිංචි ඒ.එච්. අමරතුංග මහතාගේ නිවසට පානීය ජලය ලබා ගැනීම සඳහා ජලසම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තුව ප්‍රකාරව රු.25000.00ක මුදලකට යටත්ව ලබා දීම සුදුසු බව ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය

විවාද

බණ්ඩාරවෙල, පහල කහත්තේවෙල , බොරගහ උල්පත ලිපිනයේ පදිංචි ඒ.එච්. අමරතුංග මහතාගේ නිවසට පානීය ජලය ලබා ගැනීම සඳහා රු.25000.00ක මුදලකට යටත්ව ජලසම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තු ගත මුදල පිළිබඳ සහතික ලබා ගැනීමෙන් අනතුරුව අදාල මූල්‍ය ප්‍රතිපාදන ජල සම්පාදන මන්ඩලයට ගෙවීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

මැණික්කන්ද ප්‍රජාවගේ ඉල්ලීම පරිදි මැණික්කන්ද පරදෙහි අරාව මාර්ගය කාර්මික නිලධාරි ඇස්තමේන්තු ගත රු 275,000.00 මුදල සභා අරමුදලින් දරා සිදු කිරීම සුදුසු බව ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා විසින් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය

විවාද

මැණික්කන්ද ප්‍රජාවගේ ඉල්ලීම පරිදි මැණික්කන්ද පරදෙහි අරාව මාර්ගය කාර්මික නිලධාරි ඇස්තමේන්තු ගත රු 275,000.00 මුදල සභා අරමුදලින් දරා සිදු කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.01.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2021 දෙසැම්බර් මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 08.වෙනත් කරුණු

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ප්‍රභාහර් මහතා විසින් අදහස් ප්‍රකාශ කරමින් 2022 වර්ෂයේ ආරම්භය සඳහා සුභ පැතුම් ප්‍රාර්ථනා කරනු ලබන බවත් අතිගරු ජනාධිපතිතුමන්ගේ මැදිහත් වීම ප්‍රාදේශිය සභා ධූර කාලය තවත් වසරකින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තමා ශෝකය පළ කරන බවත් හේතුව වනුයේ වසර 04ක කාලයක් තුළ මහජනතාව සඳහා සුදුසු පරිදි සේවය කිරීමට අපහසුව ඇති වූ බවත් මෙම ඉදිරි වර්ෂයේ දී ජනතාව වෙනුවෙන් කැප වී සේවය ලබා දීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.
එසේ ම හපුතලේ වත්තට පිවිසෙන ප්‍රධාන මාර්ගයේ කාපට් කර ඇති කොටසක් කැඩී ඇති බවත් එම කොටස ගරු සභාපතිතුමන්ගේ මැදිහත් වීම මත සභා අරමුදලින් සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින අතර හපුතලේ වත්ත පාසලට පිවිසෙන පඩිපෙළ සහිත මාර්ගය ද සංවර්ධනය කර දෙන ලෙසත් , කහගල්ල වත්තට පිවිසෙන ප්‍රධාන මාර්ගයේ නාය යෑම් සිදු විය හැකි ස්ථාන 02ක් ඇති බවත් මේ සම්බන්ධයෙන් සුභ සාධක නිලධාරීතුමිය දැනුවත් කල ද ආපදා කළමණාකරණ අංශයෙන් පැමිණ ඒ පිළිබඳ සොයා නොබැලූ බව ද දැන්වූ අතර මේ සඳහා ගරු සභාපතිතුමන් මැදිහත් වී යම් කිසි තීන්දුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.
අවුරුදු 04ක කාලයක් අප සමඟ මහජනතාවට සේවා ලබා දුන් ගරු සභාපතිතුමන් සහ සභා ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට ලංකා කොන්ග්‍රස් පක්ෂය වෙනුවෙන් එතුමන්ගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් හපුතලේ වත්ත පාසලට පිවිසෙන පඩිපෙළ සහිත මාර්ගය මේ වන විට සංවර්ධනය කර ඇති බවත් තවත් සුලු කොටසක් ඉතිරිව ඇති බැවින් එකී කොටසද කඩිනමින් සංවර්ධනය කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් ප්‍රකාශ කරමින්, වර්තමානය වන විට ජනතාව දැඩි ජීවන බරකින් පෙළෙන බවත් රජය විසින් ගෙන ඇති තීරණ තීන්දු මත රු.5000.00 ක දීමනාවක් රාජ්‍ය සේවකයන් හට පමණක් හිමි වන බවත් පෞද්ගලික අංශයේ රැකියාවන් හි නිරතවන්නන් මෙන්ම වතු කම්කරුවන් , ස්වයං රැකියාවල නිරත වන පුද්ගලයන්, ඉදි කිරීම් ක්ෂේත්‍රයේ නිරතවන්නන් මෙන්ම සියලු ජනතාව විශාල ජීවන අර්බුධයකින් පෙළෙන බවත් භාණ්ඩ මිල ඉතා සීග්‍රයෙන් ඉහල යන අතර ඒ සඳහා පාරිභෝගික අධිකාරිය මැදිහත් නොවන බැවින් රජය විසින් මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් , මෙකී තත්ත්වයෙන් ජනතාව මුදවා ගැනීම සඳහා ජනතාවට සහන සැලසිය යුතු බවත් , එසේම අසරණ ගොවි ජනාතාවට පොහොර නොමැති වීම හේතුවෙන් විශාල ගැටලු වලට මුහුණ දී ඇති බවත් ඒ සඳහා නිසි විසඳුම් ලබා දිය යුතු බවත් ප්‍රකාශ කළ අතර වර්තමානය වන විට විදුලි කප්පාදුව සම්බන්ධයෙන් රජය විසින් ගනු ලබන තීන්දු තීරණ පිළිබඳ කිසිම විශ්වාසයක් තැබිය නොහැකි බවත් මෙලෙස දිගින් දිගටම කටයුතු සිදු වනුයේ නම් ජනතාව ඒ වෙනුවෙන් පෙළ ගැසීම

නැවැත්විය නොහැකි බවත් මෙකී සියලු කරුණු සලකා බලා අඩු ආදායම්ලාභී සහන ලැබිය යුතු පුද්ගලයින් හට මෙන්ම කෘෂි කාර්මික ජනතාවට සහන සැලසීම සිදු කල යුතු බවත් හපුතලේ නගරයේ සමුපකාර තොග වෙලඳ සංස්ථාවක් ස්ථාපිත කිරීම සඳහා දිගින් දිගටම කටයුතු කළ ද මේ වන තෙක් එකී කටයුතු සාර්ථක කර ගත නොහැකි වී ඇති බවත් මෙවැනි සතොස ආයතන බිහි කිරීම තුළින් වෙළඳපළ ඒකාධිකාරීය නතර කිරීමට රජය මැදිහත් විය යුතු බවත් ප්‍රකාශ කරන ලද අතර එසේම මේ වන විට අක්‍රියව පවතින වීථි ලාම්පු අලුත්වැඩියා කර දෙන ලෙසත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දියතලාව නගරය තුළ ද ප්‍රමාණවත් ඉඩකඩ පවතින බිම් මහළක් තිබේ නම් සතොස අලෙවිසැලක් ආරම්භ කළ හැකි බවත් එකී අලෙවිසැලෙ හි ඉදිරිපස අඩි 35-40ත් අතර ප්‍රමාණයක ඉඩකඩක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් දියතලාව පොලීසියට ඉදිරිපසින් ඉදි කරනු ලබන ගොඩනැගිල්ල ඒ සඳහා යොදා ගත හැකි ද යන්න විමසන ලද අතර මේ වෙනුවෙන් සෑම අලෙවිසැලක්ම පරීක්ෂා කළ අතර ඒ වෙනුවෙන් සුදුසු ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් දියතලාව නගරයේ මේ වන විට නොමැති බවත් ඉඩමක් ලද වහාම සතොස අලෙවිසැලක් ආරම්භ කිරීමට අවශ්‍ය සියලු කටයුතු කඩිනමින් සිදු කරන බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් වීථි ලාම්පු සවි කිරීම පළමුව සිදු කල යුතු බව ප්‍රකාශ කරන ලදී.
දියතලාව මහ විද්‍යාලය අසල සවි කර ඇති වීථි ලාම්පුව ද මේ වන විට ක්‍රියා විරහිතව ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු ප්‍රකාශ කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා ද වීථි ලාම්පු අක්‍රිය වීම සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.එල්. සුදර්ශන මහතා අදහස් ප්‍රකාශ කරමින් දියතලාව මහ විද්‍යාලයේ ක්‍රීඩා පිට්ටනිය ඉදි කිරීම හේතුවෙන් පස් දොඩම්වත්ත මාර්ගයට රොක් වී ඇති බැවින් වර්ෂාව පතිත වීමෙන් පසුගිය දිනයන් හි මාර්ගය භාවිතා කරන්නන්හට විශාල හිරිහැරයක් ඇති වූ බැවින් ඒ සඳහා අදාල පාර්ශව දැනුවත් කරන ලෙසත් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග යොදා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් ප්‍රකාශ කරමින් ක්‍රීඩා පිට්ටනිය ඉදි කිරීමේ දී එහි කෙළවරට යොදනු ලබන පස් මට්ටම් කිරීම සිදු වන බැවින් මාර්ගයට අවහිරයක් නොවන බවත් කානු පද්ධතියක් ද යෙදීමට නියමිත බැවින් මාර්ගය භාවිතා කරන්නන් හට මෙකී ඉදි කිරීම් අවසානයේ දී අපහසුතාවක් ඇති නොවන බවත් කෙසේ හෝ ඉදි කිරීම් අතරතුර අපහසුතාවයට ලක් වන්නේ නම් දිවා රාත්‍රී ඕනෑම අවස්ථාවක දී කොන්ත්‍රාත්කරුගේ සහයෝගයද ඇතිව එකී අපහසුතාවය මගහරවා ගැනීම සඳහා කඩිනමින් පියවර යොදා ගන්නා බවත් පාසලේ ක්‍රීඩා භූමිය ඉදි කර අවසන් වන තුරු සිදු වන අපහසුතාවය සඳහා කැපවීමක් සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ක්‍රීඩා පිට්ටනිය ඉදි කිරීමේ දී කපනු ලබන පස් එහි කෙළවරට යොදනු ලබන්නේ එකී ස්ථානයේ ඉදි කිරීමට නියමිත බැම්ම සඳහා මට්ටම් වීමට බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් ප්‍රකාශ කරමින් නො.09 සිට මැණික්කන්ද හරහා මාර්ගය කැටගල් අල්ලන ලද මාර්ගයක් බවත් එකී මාර්ගය මේ වන විට වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ යුධ හමුදාව බවත් එකී මාර්ගයේ කානු පද්ධතියක් නොමැති විම හේතුවෙන් වර්ෂා ජලය

මාර්ගය හරහා ගමන් කරන බැවින් මේ වන විට කැට ගල් ගැළවී මාර්ගය අබලන් තත්ත්වයට පත් වී ඇති බවත් යුධ හමුදා කඳවුරට මායිම්ව ඇති පැත්තෙන් කානුවක් කපා වැසි ජලය බැසයාමට ඉඩ සලස්වනුයේ නම් මාර්ගය ආරක්ෂා කර ගත හැකි බවත් මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.
එසේම 2021 වර්ෂයේ ලබා දුන් ඇතැම් අයවැය යෝජනා මේ වන විට ක්‍රියාත්මක වී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කර අදාල යෝජනා 2022 වර්ෂයේ හෝ සිදු කිරීමට අවශ්‍ය පියවර යොදන ලෙසත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් එකී කාණු පද්ධතිය ඇත්තේ යුධ හමුදා කඳවුරට මායාම්ව බවත් වෙනත් පාර්ශවයකට එහි කානු කැපීම සිදු කළ නොහැකි බවත් වර්තමානය වන විට යුධ හමුදා ඉදි කිරීම් සඳහා විශාල ප්‍රතිපාදනක් රජය මගින් ලැබී ඇති හෙයින් එකී ආයතනය දැනුවත් කර කානුව පිළිසකර කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් නො.09 සිට මැණික්කන්ද හරහා මාර්ගය යුධ හමුදා කඳවුරට මායිම්ව ඇති පැත්තෙන් කානුවක් කැපීම යුධ හමුදාව පෙර අවස්ථා ගණනාවක දී දැනුවත් කළ ද එම කටයුතු මේ වන තෙක් සිදු නොවීම හේතුවෙන් එකී මාර්ගයේ කානු පද්ධතිය කොන්ක්‍රීට් කරන ලෙස නැවත වතාවක් අදාල ආයතනය දැනුවත් කිරීම සිදු කර එසේත් සිදු නොවන්නේ නම් සභාව මැදිහත් වී කානුවක් කැපීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සගාදේවන් මහතා අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් , ගරු උප සභාපතිතුමන් . ගරු විපක්ෂනායකතුමන් ඇතුලු ගරු මන්ත්‍රී මණ්ඩලයට ලැබුවා වූ නව වසර සඳහා සුභ පැතුම් එක් කරන බවත් රජයේ තීරණ මත සභා ධූර කාලය තවත් වසර 01කින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තමා සතුට ප්‍රකාශ කරන බවත් ගත වූ වසර 04 තුළ සභාව විසින් මහජනතාවට විශාල සේවයක් සිදු කළ බවත් ඉදිරියට ඇති වර්ෂය තුළද යම් කිසි හෝ සේවයක්, සංවර්ධන කටයුත්තක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කළ අතර හපුතලේ ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු නිසි පරිදි සේවයේ නොයෙදෙන බවත් එසේම අක්‍රියව පවතින වීථි ලාම්පු සම්බන්ධයෙන්ද එකී කටයුතු වල නිරත සේවකයන් නිසි පරිදි සේවා සැපයීම සිදු නොකරන බවත් ගරු සභාපතිතුමන් මැදිහත් වී මේ සඳහා අවධානය යොමු කර නිසි විසඳුම් කඩිනමින් ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.
එසේම ගරු සභාපතිතුමන් මෙන්ම මන්ත්‍රී මණ්ඩලය මැදිහත් වී තම අසනීපය සඳහා ආධාර ලබා දීම ට ගන්නා ලද තීරණය සම්බන්ධයෙන් තම ස්තූතිය ප්‍රකාශ කරන බවත් මින් ඉහත අවස්ථාවක දී ගරු සභාපතිතුමන්ගේ මාසික වැටුප පවා තම හට ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් ලබා දුන් බවත් මේ සියල්ල සම්බන්ධයෙන් තම ස්තූතිය ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරමින් මාසික දීමනාවෙන් කොටසක් හෝ ලබා දීම සුදුසු යැයි ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරමින් මහ සභාවේ දී යෝජනා ස්ථිර කර ගත් පරිදි රු.100,000.00 ක ආධාර මුදල් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සගාදේවන් මහතා හට ලබා දීමටත් මාස 03 ඉක්ම වූ පසු නැවත ප්‍රාදේශීය සභාවේ අදායම මත එතුමන්ගේ ඖෂධ සඳහා ආධාර මුදල් ලබා දීම සිදු කිරීම තීරණය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා අදහස් ප්‍රකාශ කරමින්, උදා වූ නව වසර කොවිඩ් -19 වෛරසයෙන් තොර වසරක් වේවා යි ප්‍රාර්ථනා කරනු ලබන අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.

සගාදේවන් මහතා සමඟ තමා එකම ඡන්ද කොට්ඨාසය නියෝජනය කරන බැවින් පෞද්ගලිකව තරඟයක් තිබුණ ද මෙලෙස එතුමා මාස 1 ½ ක පමණ කාලයක් තුළ සිට රෝගී තත්ත්වයට පත් වී සිටින බැවින් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මින් පෙර මිල කමිටුව පැවති අවස්ථාවේ සාකච්ඡා සිදු කළ පරිදි ගරු ලේකම්තුමිය දැනුවත් කර සියලුම දෙනා එකතු වී එතුමන්ට උදවු උපකාර කල යුතු බවත් එතුමා සභාව නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන අතර එතුමන්ගේ ඡන්ද කොට්ඨාසය මේ වන විට බොහෝ සෙයින් සංවර්ධනය කර ඇති බවත් ග්ලැනනෝර් නිවාස ව්‍යාපෘතියෙ හි දී එතුමන් විශාල සහයෝගයක් ලබා දුන් බවත් , මුල අමතක නොකල යුතු බවත් ප්‍රකාශ කළ අතර එතුමාට ඉක්මනින්ම නිරෝගී සුවය ලැබේවා යි ප්‍රාර්ථනා කරන ලදී.
එසේම මෙම සභා වාරය නව වසරේ පළමු සභා රැස්වීම බවත් මහ සභා රැස්වීම් වලදී සංදේශ හා පෙත්සම් යටතේ ලබා දෙනු ලබන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය ආයතන දැනුවත් කර පිටපත් ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ලැබීමට සැලැස්වුව ද මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන ලද ලිපිය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු මේ වන තෙක් සිදු වී නොමැති බවත් එකී ආයතන නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්, සංදේශ හා පෙත්සම් යටතේ ලබා දෙනු ලබන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය ආයතන දැනුවත් කර පිටපත් ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ලැබීමට සලස්වන බවත් මන්ත්‍රී මණ්ඩලය ලෙස මැදිහත් වී එකී ලිපිය සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කරමින් අදාල කටයුතු ඉදිරියට පවත්වා ගෙන යායුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.සගාදේවන් මහතා අදහස් දක්වමින් ග්ලැනනෝර් වසමේ පිහිටි ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ලක්ෂ 5 ක ප්‍රතිපාදන මුදලක් මත අදාල ලිපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කළ ද තාක්ෂණික නිලධාරීන් ඒ පිළිබඳ කිසිදු තැකීමක් නොකළ බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වමින්, සංදේශ හා පෙත්සම් යටතේ ලබා දෙනු ලබන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය ආයතන දැනුවත් කර පිටපත් ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ලැබීමට සලස්වන බවත් මන්ත්‍රී මණ්ඩලය ලෙස මැදිහත් වී එකී ලිපිය සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කරමින් අදාල කටයුතු ඉදිරියට පවත්වා ගෙන යායුතු බවත් එසේ අදාල ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකරන්නේ නම් නැවතත් සභාපතිතුමන්ව පෞද්ගලිකව හෝ දැනුවත් කර අදාල ආයතන දැනුවත් කිරීමෙන් කටයුතු අඛන්ඩව පවත්වා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි තංගවේලු මහේන්ද්‍රන් මහතා අදහස් ප්‍රකාශ කරමින්, හපුතලේ දඹේතැන්න මාර්ගයේ ධාවනය වන පාසල් බස් රථය ආරම්භක ස්ථානයේ දී මෙන්ම අතරමඟදී ද පාසල් ළමුන්ගෙන් බස් රථය පිරීම හේතුවෙන් ඇතැම් අවස්ථාවලදී අතරමගින් බස් රථයට ගොඩවන ළමුන් ඇතැම් දිනවල දී මාර්ගයේ දමා යන බැවින් එම සිසුන් අපහසුතාවයට ලක් වන බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.